# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 39 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 09/01/2024<br>පැය 1100 |

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.</u>**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර.**

2024.01.08 වන දින සවස් කාලයේදී මරදාන පොලිස් වසමේ සේරම් පාර ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 60 මිලිග්‍රෑම් 580ක්, මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැකකරන මුදල් රුපියල් 95840/=ක් හා ජංගම දුරකතනයක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මරදාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන මරදාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරදාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර.**

2024.01.08 වන දින සවස් කාලයේදී මරදාන පොලිස් වසමේ නොරිස් කැනල් ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 40 මිලිග්‍රෑම් 350ක්, යතුරුපැදියක් හා ජංගම දුරකතනයක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මරදාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරදාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**03. ගංජා හේනක් වටලා සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

2024.01.08 වන දින දහවල් කාලයේ හම්බේගමුව පොලිස් වසමේ මයිලවල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගංජා හේනක වැටලීමක් සිදු කර **වගා කර තිබූ ගංජා ගස් 4764ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන හම්බේගමුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ මයිලවල, හම්බේගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. හම්බේගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුර.**

2024.01.08 වන දින දහවල් කාලයේ තිරුක්කෝවිල් පොලිස් වසමේ කංචිකුඩිච්චිආරු ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තිරුක්කොවිල් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වූ තිරුක්කෝවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. තිරුක්කොවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරුගම්බේ කඳවුර.**

2024.01.08 වන දින උදෑසන කාලයේ පොතුවිල් පොලිස් වසමේ දාරම්පලාව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අරුගම්බේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වූ පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. අනවසරයෙන් ස්කැවේටර් යන්ත්‍රයක් මගින් පතල් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2024.01.08 වන දින සවස් කාලයේ රත්නපුර පොලිස් වසමේ හොරකැල්ල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර අනවසරයෙන් ස්කැවේටර් යන්ත්‍රයක් මගින් පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇහැළියගොඩ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත භාර දි ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29 හා 51 වයස් වල පසුවන හොරකැල්ල හා කුරුවිට ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.